# සාරාංශය

ශීඝ්‍රයෙන් වෙනස් වන වර්තමාන සමාජයේ සංකීර්ණතාවයන් පාසල් පද්ධතිය තුළින්ද හඳුනා ගත හැකිය. යෞවනවියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගුරුවරුන්ට අවනත නොවීම නිසා පාසල් වසා දමන්නට සිදු වීම එවැනි එක් ප්‍රතිඵලයකි. මෙම තත්ත්වය මත වඩා යහපත් සමාජයක් උදා කරලීමට නම් ගුරු භූමිකාව තුළ යම් ආකාරයක වෙනසක් ඇති විය යුතු ය. එසේම වෙනස්වන සංකීර්ණ සමාජ රටාට තුළ ගුරු පෞරුෂය ගෞරවනීය ලෙස පවත්වා ගැනීමට නම් එහිදී ද ගුරු භූමිකාව තුළ යම් වෙනසක් සිදුවිය යුතු ය.

මේ අනුව පශ්චාත් නව යෞවන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වර්තමාන යුගයේ ගුරු භූමිකාව සංජානනය කරන ආකාරය හඳුනාගැනීමටත් එමගින් ඔවුන් ගුරුවරුන් වෙතින් බලාපොරොත්තු වන ගුණාංග කවරේද යන්න සොයා බැලීමටත් මෙම අධ්‍යයනයේ දී උත්සාහ ගන්නා ලදී.

මෙම අධ්‍යයනයේදී මුලින්ම සාහිත්‍ය විමර්ශනයක් තුළින් නව යෞවන අවධියේ ගති ලක්ෂණ, ගුරු භූමිකාව පිළිබඳ විවිධ අධ්‍යාපනඥයින් පළකළ අදහස් මෙන්ම ගුරු භූමිකාව තුල තිබිය යුතු ගුණාංග හඳුනා ගන්නා ලදී.

අධ්‍යයනයේදී නියැදිය ලෙස තෝරා ගන්නා ලද්දේ මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ සියළුම 1AB පාසල් වල දහතුන් වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුන්සිය අසූහතර දෙනෙකි.

අධ්‍යයනයේදී "ගුරුවරයෙකුගේ මා අගය කරන ලක්ෂණ" හා ගුරුවරයකු තුළ නොතිබිය යුතු ලක්ෂණ" වශයෙන් අදාල ජනගහණය නියෝජනය කරන සිසුන් කණ්ඩායමක් දක්වා තිබූ අදහස් අංශ හතරක් යටතේ වර්ග කර ගුරු භූමිකාව පිළිබඳ ගුණාංග ඇතුලත් වන ආකාරයට ලයිකර්ට් පරිමාණයට අයත් ප්‍රශ්නාවලියක් පිළියෙල කර නියැදියට ලබා දෙන ලදී.

ප්‍රශ්නාවලිය මගින් ලද තොරතුරු ලයිකර්ට් පරිමාණයට අනුව විශ්ලේෂණය කිරීමෙන් ගුරු භූමිකාව පිළිබඳ නව යෞවනයින්ගේ සංජානනයන් හඳුනා ගන්නා ලදී. ඔවුන් දී ඇති තරාවන් අනුව නව යෞවන සිසු සිසුවියන් ගුරුවරුන් තුළ පැවැතිය යුතු යැයි සංජානනය කරන වඩා වැදගත් ගුණාංග හඳුනා ගන්නා ලදී. අනතුරුව මෙම සංජානනයන් නව යෞවනයින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව හා ඔවුන් හදාරන විෂය ධාරාව අනුව වෙනස් වේදැයි සොයා බලන ලදී. ප්‍රශ්ණාවලිය විශ්ලේෂණයේ දී නව යෞවන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සියයට හැත්තෑහයක් පමණ සලකන ලද ගුණාංග ධනාත්මක ආකාරයට සංජානනය කර ඇති බවක් දක්නට ලැබුනි. මෙම සංජානනය නව යෞවනයින්ගේ ස්ත්‍රී

පුරුෂ භාවය අනුව එතරම් වෙනස් නොවුවද නව යෞවනයින් හදාරන විෂය ධාරාව අනුව, සලකන ලද බොහෝ ගුණාංග සංජානනය කරන ආකාරයෙහි වෙනසක් දක්නට ලැබුනි.

හොඳ ගුරුවරයෙකු සතු ගුණාංග තරා කිරීමේදී මුල් තැනට පැමිණ තිබුනේ "ගුරුවරුන් සැම විටම කාරුණික විය යුතුය" යන්න හා "සැමට පැහැදිලි වන ආකාරයට සරල ලෙස ඉගැන්වීම" වේ.

අධ්‍යනයේදී අනාවරණය වු කරුණු ගුරු කාර්ය සැසි වලදී මෙන්ම ගුරු පුහුණු පාඩමාලාවලදී ගුරුවරුන් දැනුවත් කිරීම පිණිස යොදා ගත හැක.